# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2238/41 – 2021 ජූලි මස 30 වැනි සිකුරාදා – 2021.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, 275/A හෙයියන්තුඩුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෙයියන්තුඩුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BIY/2019/494 හා 2019.09.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'B' – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0088 ක් පමණ**

උතුරට: ශ්‍රී දේවමිත්ත පාරේ වරි. අංක 0215/063 දරන ඉඩම සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: කැබලි අක්ෂර A, අධිවේගී මාර්ගය සඳහා වෙන්කල බිම සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: පාර, කැබලි අක්ෂර D, C සහ ශ්‍රී දේවමිත්ත පාරේ වරි. අංක 0215/063 දරන ඉඩම.

02. **කැබලි අක්ෂර 'C' – දෙල්ගහවත්ත, වරි. අංක 0215/063, ශ්‍රී දේවමිත්ත පාර – ප්‍රමාණය: හෙක්. 0.0021 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: ඩබ්ලිව්. ඩී. දීපාල් රොද්‍රිගු හිමිකම් කියන දෙල්ගහවත්ත සහ කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B සහ D; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

03. **කැබලි අක්ෂර 'D' – ප්‍රමාණය: හෙක්. 0.0004 ක් පමණ**

උතුරට: ශ්‍රී දේවමිත්ත පාරේ වරි අංක 0215/063 දරන ඉඩම සහ කැබලි අක්ෂර C; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: ඩබ්ලිව්. ඩී. දීපාල් රොද්‍රිගු හිමිකම් කියන දෙල්ගහවත්ත සහ පාර; බටහිරට: පාර සහ ශ්‍රී දේවමිත්ත පාරේ වරි. අංක 0215/063 දරන ඉඩම.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2018/WS/473.
2021 මාර්තු මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 135



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.